# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2312/73 - 2022 දෙසැම්බර් මස 31 වැනි සෙනසුරාදා - 2022.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියමය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නියමය මඟින් එම වගන්තිය යටතේ 2019 නොවැම්බර් 14 දිනැති අංක 2149/18 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 1465/20 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමය එහි උපලේඛනයේ 36 වැනි අයිතමයට ඉක්බිතිව පහත දැක්වෙන නව අයිතමය එකතු කිරීම මඟින් සංශෝධනය කරමි.

37. "2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනත බලාත්මක වන දින සිට, රජය පාර්ශවකරුවෙකු වන ගිවිසුමකට අනුව 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව විසින් කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ බල ප්‍රදේශයේ සීමාව තුළ ඕනෑම ඉඩමක් බදු දීමක් සම්බන්ධයෙන්, බදු වාරිකය සහ/හෝ කල්බදු කුලිය/ප්‍රතිෂ්ඨාව, බදුකරු විසින් අදාළ වන පරිදි රජයට හෝ එකී කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවට මුදලින් ගෙවිය යුතු නොවන අවස්ථාවක, එවැනි බදු දීමකට අදාළ ඕනෑම සාධනපත්‍රයක්"

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 01 - 0131

1A - PG 6165 — 456 (2023/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*